

# බලයට පත්කළ යුත්තේ කාව ද?

අද මේ ප්‍රශ්නය බෙහෙවින් විවාදයට ලක් වී ඇත. මහින්ද රාජපක්ෂ පාලනයේ අත්තනෝමතික ක්‍රියාවන් නිසාත්, පවුල් බලය ගොඩනැඟීම නිසාත්, දූෂණය නිසාත්, එජාපය 1977 සිට පවත්වාගෙන ආ ප්‍රතිපත්ති එලෙසම අනුගමනය කිරීම නිසාත් ජනතාව කළකිරීමට පත්වෙමින් සිටිති. මැතිවරණ බෙහෙවින් දූෂිත ය. භීෂණය ද ඇත. මර්දනය නැත්තේ නොවේ. තව ද, ජනාධිපති ධූරයේ කාලසීමාව දික්කරගැනීම සඳහා ව්‍යවස්ථා සංශෝධන සම්මත කොටගෙන ඇත. මේ සියල්ල නිසා ''මහින්ද රාජපක්ෂ පැරදවීම'' බොහෝ දෙනාගේ සිහිනය වී ඇත. එහෙත් මහින්ද රාජපක්ෂ පැරදවීම ලේසි පහසු කාර්යයක් නොවන බව බොහෝ දෙනා දනිති. මේ අනුව මහින්ද රාජපක්ෂ පාලනය පරාජය කළහැකි බලවේගයක් ගොඩනැඟීම ගැන බොහෝ අය හිතති.

මෙය කළ හැක්කේ කාට ද? සරලව හිතුවොත් එජාපයට ලංකාවේ ඡන්ද 25 ලක්ෂයක් ඇති බවත්, ඒ ඡන්ද නොමැතිව මහින්ද පරාජය කළ නොහැකි බවත් ඇතැම් අය සිතති. එබැවින් එජාපය හා රනිල් සමග එකතු විය යුතු බව ඔවුන්ගේ මතයයි. මෙය පැතිරී යා හැකි ප්‍රබල මතයකි. මෙය නිවැරදි ද? මහින්ද රාජපක්ෂ පරාජය කළ යුත්තේ ඔහු නරක මිනිහෙකු නිසා පමණක් නොවේ. රනිල් වික්‍රමසිංහ දිනවීමට තරම් හොඳ මිනිහෙකු ද නොවේ. එහෙත් වැදගත් ප්‍රශ්නය මෙය නොවේ. ඔවුන් කවුරුන් හෝ බලයට පත්වන්නේ යම් පන්තියක් නියෝජනය කිරීම සඳහා ය. බලයට පත් වූ පසුව ඔවුනට එම පන්තියට උවමනා දේ කිරීමට සිදුවේ. මහින්ද රාජපක්ෂ අද නියෝජනය කරන්නේ ධනපති පන්තියයි. ශ්‍රී ලංකාවේ ධනපති පන්තිය ක්‍රියාකරනුයේ ජාත්‍යන්තර ධනපති පන්තියට උවමනා පරිදි ය. ඔවුන් අතර අද ප්‍රතිවිරෝධයක් නැත. ගෝලීය ධනවාදී ක්‍රමය විසින් එම ප්‍රතිවිරෝධයන් සමනය කර ඇත. මහින්ද රාජපක්ෂ තම ප්‍රධාන උපදේශකයින් හා සහයකයින් ලෙස පත්කොට ඇත්තේ ඔහුගේ සහෝදර බැසිල් රාජපක්ෂ හා ගෝඨාභය රාජපක්ෂ වැනි අය ය. මීට අමතරව මහ බැංකුවේ අධිපති වරුන් ලෙස පී.බී. ජයසුන්දර හා අජිත් නිවාඩ් කබ්රාල් වැනි අය පත්කොට ගෙන සිටිති. බැසිල් හා ගෝඨාභය රාජපක්ෂ වැනි අය ඇමෙරිකාවේ පුහුණුව ලැබූ අය වෙති. ඔවුහු අනුගමනය කරනුයේ ඇමෙරිකානු ධනවාදයේ මාවතයි. මීට අමතරව චීනය වැනි රටවල සහයද ලබාගනිති. චීනයේ ගමන් මග ඇමෙරිකානු ගමන් මගට වඩා වෙනසක් නැත. අද චීනය ප්‍රධාන පෙළේ ගෝලීය ධනපතියා බවට පත්වෙමින් සිටී. මේ අනුව ගෝලීය ධනවාදයේ මග හැර වෙනත් මගක් ගැනීමේ අදහසක් මහින්ද රාජපක්ෂට හෝ ඔහුගේ සගයින් තුළ නැත.

දැන් රනිල් වික්‍රමසිංහ බලයට පත් කරනු ලැබුයේ යැයි සිතමු ඔහුට මීට වඩා වෙනස් මඟක් තිබේ ද? ඔහුට කළ හැක්කේ හා කළහැකි වන්නේ ඒ මඟම වඩා ශක්තිමත්ව, ප්‍රබලව හා කුරිරු ලෙස ගමන් කිරීමට පමණි. මේ වෙනස ගැන අප වෙහෙස නොවිය යුත්තේ ඒ නිසා ය.

එසේ නම් අපි නැවතත් මහින්ද රාජපක්ෂ බලයට පත් කිරීමට මහන්සි විය යුතු ද? නැත... ඔහු ඉදිරි කාලය තුල වඩාත් අයුක්ති සහගත කුරිරු පාලකයකු වනු නියතය. එජාපයෙන් විශාල පිරිසක්, මන්ත්‍රීවරු පිල් මාරුකොට මහින්දට එක් වූහ. ඒ අතර ළඟ දී පිල් මාරු කළ දයාසිරි ජයසේකර, ජොන්ස්ටන් ප්‍රනාන්දු වැනි අය පමණක් නොව ආණ්ඩුවේ ප්‍රබලයෝ වන ජී.එල්. පීරිස්, සරත් අමුණුගම වැනි අය ද වෙති. ඔවුහු පිල් මාරු කළ නමුත් මඟ වෙනස් කළේ නැත. මහින්ද රාජපක්ෂ එජාපයේ දේශපාලන දර්ශනය ඔස්සේ ක්‍රියාකරන හෙයින් ඔවුහු ඒ සමග පහසුවෙන් සිටිති. එය ක්‍රියාත්මක කරති. මහින්දම ආවත්,  රනිල් ආවත්, එය වඩා නරක අතට හැරෙනවා හැර වෙනයමක් සිදු නොවනු ඇත.

එබැවින් බලය දියයුත්තේ මොවුන් අතරින් කාට ද? කියන එක ප්‍රශ්නයක් නොවේ. ප්‍රශ්නය... බලය කවුරුන් අතට පත්වුවත් මහජනතාවට තම ඉල්ලීම් දිනාගැනීම සඳහාත්, අයිතීන් දිනාගැනීම සඳහාත්, කුමක් කළ යුතු ද? යන්න ය. බලය කාට ගියත් කමක් නැත. හෙට රනිල් හෝ එජාපය බලයට පත් වුවහොත්, ඉතා ටික කළකින් අපි කවුරුත් ඒ පාලනය පරාජය කළයුතු යැයි කියනු නියතය. බලය ලබාගන්නේ නැතුව පාලනය පරාජය කළ හැකි ද? ඒ කෙසේ ද? අප විසඳිය යුතු ප්‍රශ්නය එයයි.

**බලය ලබාගන්නේ නැතිව පාලනය පරාජය කළහැක්කේ කෙසේ ද?**

බලය ඇත්තෝ පාලන නියෝග පනවති, නීති රීති ගෙනෙති. ඒවා පරාජය කළ හැක්කේ, ඒවා අසාධරණ නම්, ඒවාට අවනත නොවීමෙනි, අසාධාරණ නීති කඩකිරීමෙනි. මෙය කළ හැකි ද? ඒ කෙසේ ද? ජනතාව සංවිධානය විය යුතු ය. සංවිධානාත්මක දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගිය යුතු ය. එය රටේ පාලන බලය ඉල්ලා සිටින ඒ සඳහා මහජන ඡන්දය ඉල්ලා සිටින පක්ෂයක් වීම අවශ්‍ය නැත. බලය ඉල්ලා නොසිටින දේශපාලන පක්ෂයක් තිබිය හැකි ද? එසේ තිබිය නොහැකි යැයි කියන තරමට අද දේශපාලනය දුබල වී ඇත. දේශපාලනය යන්නෙහි නියම අර්ථය තීරණගැනීමේ බලය යන්නයි. තීරණගැනීමට දේශපාලන බලය තිබීම ම අවශ්‍ය නැත.

මහත්මා ගාන්ධිතුමා, බ්‍රිතාන්‍යයන් විසින් ඉන්දියාව පාලනය කරමින් තිබූ කාලයේ දී දේශපාලනය කළේ ය. එතුමාගේ දේශපාලනය වුයේ සිවිල් නීති කඩකිරීමයි.

ඉංග්‍රීසීන් ඉන්දියානුවන්ට ඉන්දියාවේ දී ලුණු වේලීම තහනම් කොට තිබුණි. මෙය අසාධාරණ නිතියක් වන හෙයින් එයට තමා අවනත නොවන බව එතුමා ප්‍රකාශ කළේ ය. සැතපුම් 200 ක් පාගමනකින් ගොස් වෙරළට පැමිණ ලුණු වේලීම එතුමාගේ අරමුණ විය. කැමති අයට සම්බන්ධ වන ලෙස ආරාධනා කළේ ය. අතිවිශාල පිරිසක් එකතු විය. පොලීසියට ඒ ගමන වලක්වාලීමට නොහැකි විය. එදා ලුණු වේලූ පසුව, පසුදින සිට සියල්ලෝ ලුණු වේලන්නට පටන් ගත්හ. නීතිය අවලංගු කිරීමට සිදුවිය.

තව ද, දකුණු අප්‍රිකාවේ සිටිය දී මහත්මා ගාන්ධිතුමා ඉංග්‍රීසීන් විසින් පණවා තිබූ තවත් අසාධාරණ නීතියක් දුටුවේය. කළු ජාතිකයන්ට එක් පුරවැසි හැඳුනුම්පතක් දීමත්, සුදු ජාතිකයින්ට වෙනත් හැඳුනුම්පතක් නිකුත් කිරීමත් ඒ නීතිය විය. මෙම නීතිය අසාධාරණ ලෙස දුටු මහත්මා ගාන්ධිතුමා ඒ නීතිය තමන් කඩ කරන බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කොට, එය ප්‍රසිද්ධියේ කඩ කළේ ය. කළු ජාතිකයින්ට නිකුත් කර තිබූ හැඳුනුම්පත ඔහු ප්‍රසිද්ධ ස්ථානයක දී පුළුස්සා දමන ලදී. එසේ කිරීමේ දී එතුමාට පොලිස් බැටන් පොලු පහර කන්නට සිදුවිය. එය නොතකා ඔහු නීතිය කඩ කළේ ය. මේ අනුව මහජනතාවට බලය ලබානොගෙන පාලනය පරාජය කළ හැකි වන්නේ එම පාලනය විසින් ගෙනෙන අසාධාරණ නීති කැඩීමෙනි. ඒ සඳහා දෙනු ලබන දඬුවම් යුක්තියේ නාමයෙන් විඳ දරාගැනීමට තමන් සූදානම් බව මහ ජනතාව විසින් ප්‍රසිද්ධියේ පෙන්වා දිය යුතු ය.

ලංකාවේ මෙබඳු දේශපාලනයක් ක්‍රියාත්මක කිරීම සඳහා පහසු ක්‍රම ඇත. රටේ පවතින ආණ්ඩු හා දේශපාලන පක්ෂ බලය ලබාගැනීම සඳහා ඇතැම් වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කරති. පොරොන්දු දෙති. එහෙත් බලයට පත් වූ පසු ඒවා අවංකව ක්‍රියාත්මක නොකරති. පාලනය දරා සිටින අයගේ තවත් කාර්යයක් වන්නේ සැලසුම් සකස් කිරීම ය. මහ ජනයාට පාලන බලය නැතත් සැලසුම් සකස් කිරීමේ අයිතියක් ඇත.

**මහජනතාවට සැලසුම් සැකසීමේ අයිතිය ඇත**

නිදසුන් කීපයක් ගෙන බලමු.

ලොවපුරා ආහාර මිල ඉහළ යද්දී, එනම් ලෝකයේ ආහාර මිල 40% කින් ඉහළ යද්දී ශ්‍රී ලංකාවේ ඒ මිල ඉහළයාම 100% කට වැඩි විය. හාල් කිලෝ එකක මිල රු. 20 ගණන්වල සිට රු. 60 දක්වා වැඩිවිය. පොල් ගෙඩිය රු. 40 ක් පමණ විය. පාන් රාත්තල රු. 50 දක්වා වැඩිවිය. එවිට ආණ්ඩුව විසින් ''අපි වවමු, රට නගමු'' යන වැඩපිළිවෙළ ප්‍රකාශයට පත් කරන ලදී. එහි ප්‍රකාශිත අභිලාෂය වූයේ රටපුරා ගෙවතු 40 ලක්ෂයක් ගොඩනැගීම ය. මෙය ක්‍රියාත්මක නොවුණි, ක්‍රියාත්මක කිරීමේ සැබෑ උවමනාවක් ද නොවීය. ඊට වසර කීපයකට පසුව පැවති ඊළඟ මැතිවරණයේ දී 'දිවිනැගුම' ප්‍රකාශ විය. එහි අරමුණ ගෙවතු දශලක්ෂයක් ගොඩනැඟීමට සහාය වීමය. එක් ගෙවත්තක් සඳහා රුපියල් 10,000 දක්වා වැය කිරීමට සූදානම් බව ප්‍රකාශ කෙරිණ. එහෙත් සිදුවූයේ එළවළු පැළ බීජ වර්ග 5 ක් හා රසායනික පොහොර පැකට් කීපයක් බෙදාදීම පමණි. ගමනැගුම, ගැමිදිරිය, සමෘද්ධි ව්‍යාපාරය ආදිය ද එබඳු ප්‍රකාශිත වැඩසටහන් විය. මේවා එකක්වත් නිසි පරිදි ක්‍රියාත්මක නොවුණි. මේ සියලු වැඩසටහන්වල සැලසුම් සැකසීම ගමේ ප්‍රජාව විසින් කළයුතු යැයි ප්‍රකාශිත ය. එහෙත්, එය එසේ සිදුනොවේ. රනිල් බලයට පත්වුවහොත්, මේවා නිසි පරිදි ක්‍රියාත්මක කරයි ද? කිසිසේත්ම නැත. එසේ නම් කළ යුත්තේ කුමක්ද?

කළ යුත්තේ මේවා සැලසුම් කිරීම මහ ජනතාවට අතට ගැනීම ය. එය දනට ඇති නීතිවලට එකඟය. තම ගෙවත්ත, පාරිසරික කෘෂිකර්ම ක්‍රමයට සැලසුම් කිරීම සෑම පවුලකටම කළ හැකි ය. ඒ පවුල්වල සැලසුම් ඒකරාශි කිරීමෙන් ග්‍රාමීය ප්‍රජාවකට සැලැස්මක් සකස් කළ හැක. අක්කර 1/4 ක අඹ ගස් 2 ක්, කෙසෙල් ගස් කීපයක්, දෙහි, දොඩම්, ගස්ලබු ආදී ගස් කීපයක් වගා කිරීමට සැලසුම් කළ හැක. පස සෝදායාම වලක්වාලීම සඳහා වැටි දැමීම, හිරු එළිය උපරිම ලෙස පාවිච්චි කිරීම සඳහා විවිධ ස්ථරවලට ගස් සිටුවීම, මිශ්‍රබෝග වගාව, ප්‍රතිචක්‍රීයකරණය, බීජ එක්රැස්කිරීම හා බෙදාහදාගැනීම එක් එක් පවුලට කළ හැකි නම්, ඒ පවුල් සියල්ල එකතුව ගමට සැලස්මක් හදාගත හැකි ය. වස විස සහිත කෘෂිකාර්මික රසායනික ද්‍රව්‍ය නොයෙදීම ද, එම සැලැස්මට එකතු කළ හැක්කකි. මෙසේ ප්‍රජාව විසින් සකස් කරනු ලබන සැලැස්මක දී ගමට අඹ ගස්, දෙහි ගස්, දොඩම් ගස්, පැපොල් ගස්, පොල් ගස්, පුවක් ගස් ආදිය කොපමණ උවමනා වේදැයි ගණන් බැලීම පහසු ය. ඒ අනුව පැළ තවාන් යෙදීම ද, වස විස ගම තුළ  නොයෙදීම ද, සැලැස්මට එකතු විය හැකි ය. මෙබඳු සැලැස්මක් සකස් කොට, ප්‍රාදේශීය සභාවට, දිස්ත්‍රික්කයට හෝ පළාතට ඡන්දය ඉල්ලන පක්ෂ හා අපේක්ෂකයින් ලවා එම සැලසුම් ක්‍රියාත්මක කරන බවට පොරොන්දු ලබාගත යුතු ය.

ඔවුන් තේරී පත් වූ පසුව තමන් දුන් පොරොන්දු ඉටුකරන්නේ ද යන්න සොයා බැලීමටත්, ප්‍රශ්න කිරීමටත් සංවිධාන ගොඩනගා ගත යුතු ය. එම සංවිධාන දේශපාලන සංවිධාන විය යුතු ය. ඒවා බලය ඉල්ලා නොසිටින, එහෙත් දුන් පොරොන්දු ඉටුකරවා ගැනීම සඳහා සටන් කරන සංවිධාන විය යුතු ය. විය හැකි ය. මෙලෙස පහළ සිට ඉහළට බලය ඉල්ලා නොසිටින එහෙත් අයිතීන් වෙනුවෙන් හා පොරොන්දු ඉටුකරවා ගැනීම වෙනුවෙන් සටන් කරන ජනතා සංවිධාන ගොඩනැගිය හැක. ගොඩනැගිය යුතු ය.

මේ අනුව, එබඳු දේශපාලන පක්ෂයක් රටේ ජලය විකිණීමට විරුද්ධව, වස විස ගොවිතැනට විරුද්ධව, සාධාරණ මිල ගණන් ඉල්ලා, අධ්‍යාපනය හා සෞඛ්‍ය අයිතිවාසිකම් ඉල්ලා සටන් කරන පක්ෂයක් වනු ඇත. මෙසේ දේශපාලන බලය ලබාගැනීමේ බලාපොරොත්තු නොතිබූ කාලවල, වමේ පක්ෂ එසේ ක්‍රියා කළහ. කම්කරු අයිතීන් සටන් කොට දිනාගත්හ. ආහාර මිල අඩු මට්ටමේ තබාගත්හ. මිල පාලනයක් ක්‍රියාත්මක කරවා ගත්හ. නිදහස් අධ්‍යාපනය හා නිදහස් සෞඛ්‍ය සේවය දිනාගත්හ. අදත් මෙය නොකළ හැක්කක් නොවේ. මෙබඳු සැලසුම් අද මහින්ද රාජපක්ෂ පාලනයට හෝ එජාප පාලනයට කළ නොහැකි ඒවා ය. ඒ ඔවුන් ධනපති පන්තියේ වාසිය සඳහා සොබාදහම විනාශකාරී ලෙස සූරාකෑමේ  අරමුණක පිහිටා සිටින නිසා ය.

මහින්ද වෙනුවට රනිල් ගෙන ඒමෙන් සිදුවන්නේ මහින්දගේම වැනි දූෂ්‍ය පාලනයක් ගෙනයාම සඳහා රනිල්ට බලය ලබාදීම පමණි. රනිල් බලයට පත් වූ පසුව ඒ බලය පෙරලා දැමීම සඳහා යළිත් මහින්දට හෝ බැසිල්ට හෝ ගෝඨාභයට බලය ලබාදීම සඳහා යළිත් ජනතාව පෙළගැසීම හැර අන් කිසිවක් එයින් ඉටුනොවේ.

**ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්නය**

අද ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රශ්න රාශියකට ජනතාව මුහුණ පා සිටිති. මේ අතර ප්‍රධාන ප්‍රශ්නයක් වන්නේ දශලක්ෂයක් පමණ වන ලංකාවේ තවමත් සිටින දමිළ වතු කම්කරු ජනතාවට කිසිදු ඉඩම් අයිතියක් නොදී සිටීමේ ප්‍රශ්නයයි. 1948 දී ලංකාවට නිදහස ලැබුනේ යැයි කියන නමුදු වතු කම්කරු ජනතාවට කිසිදු නිදහසක් නොලැබුනි. ඔවුහු අර්ධ වහල්භාවයේ දිගටම තබාගන්නා ලද අතර 1947 දී ඔවුනට තිබූ පුරවැසි අයිතිය ද අහෝසි කෙරිණ.

ඒ ඔවුන් වමේ පක්ෂවලට ඡන්දය දෙන බව ඩී.එස්. සේනානායක මහතාට පෙනී ගිය නිසා ය. ඔවුන් ලංකාවේ සැබෑ පුරවැසියන් ලෙස පිළිගන්නේ නම් ඔවුනට ඉඩම් අයිතිය ලබාදිය යුතු ය. තමන් කැමති පරිදි නිවාස හදාගැනීමට අවස්ථාව සලසා දිය යුතු ය. සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් දියයුතුය. දරුවන්ට උසස් අධ්‍යාපනය ඇතුළු අධ්‍යාපන පහසුකම් දියයුතු ය. මේ කිසිවක් ඔවුනට දී නොමැත. මේවා ලබාදෙන බවට අද සිටින පාලක මහින්ද හෝ එන්නට සිටින පාලක රනිල් හෝ එකඟවන්නේ ද? බලාපොරොත්තු විය නොහැක්කකි. බොරුවට හෝ පොරොන්දු දෙනවා නම් හොඳය. එහෙත් එම පොරොන්දු ඉටුකරන තුරු සටන් කිරීම සඳහා සංවිධානය නොවී, ඒවා දිනාගත නොහැකිවනු ඇත.

ඉඩම් අයිතිය පිළිබඳ වෙනත් ජනතාවට ද ප්‍රශ්න ඇත. ඉඩම් සංවර්ධන ආඥා පනත (LDO) යටතේ ඉඩම් ලබා දුන් ජනතාවට එම ඉඩම් නිත්‍යානුකූලව විකිණීමේ අයිතියක් නොතිබුනි. එහෙත් එම අයිතීන් ලබා දී ඔප්පු දී, ඒවා විකුණා දමා ගොවිතැනින් බැහැරවීමට ග්‍රාමීය ජනතාවට සැලැස්වීම ලෝක බැංකුවේ යෝජනාව විය. එයට රනිල් විරුද්ධ නැත. එය ක්‍රියාත්මක කිරීම සඳහා ස්වර්ණ භූමි, ජය භූමි, රත්න භූමි වැනි ක්‍රම ක්‍රියාත්මක කරන ලදී. අද එය බිම් සවිය නමින් ක්‍රියාත්මක වෙයි. රසායනික වස විස නිසා වකුගඩු රෝග, පිළිකා රෝග, දියවැඩියාව වැනි රෝග වලින් ද, ස්වභාවික කෘමි පාලනය බිඳ වැටීම නිසා ඩෙංගු, මැලේරියා, බරවා වැනි රෝග වලින් ද විශාල ජනතාවක් මියයමින් සිටිති. ඒ විෂ කෘෂි රසායනික ද්‍රව්‍ය තහනම් කිරීමට මෙම දෙපාර්ශවයෙන් කවුරුන් හෝ ක්‍රියාත්මක වන බවක් නොපෙනේ. බලාපොරොත්තු තැබීමක් ද කළ නොහැකි ය. මේවා වෙනුවෙන් උද්ඝෝෂණය කිරීමත් අවශ්‍ය ය. මහින්ද වෙනුවට රනිල්ට හෝ සජිත්ට හෝ චන්ද්‍රිකාට හෝ මාදුළුවාවේ සෝභිත හිමියන්ට බලය ලබාදීමෙන් පමණක් ඒවා ඉටුනොවේ. උවමනා වුවහොත් මාදුළුවාවේ සෝභිත හිමියන් පවා මහින්ද රාජපක්ෂට වඩා දරුණු පාලකයකු කිරීමේ හැකියාවක් ධනපති පන්තියට ඇත. එය ලංකාවේ බලසම්පන්න ධනපතීන් සමග ජාත්‍යන්තර ධනපතීන් ද එක්ව කරන්නකි. ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රණය අද ගොඩනැගී ඇත. තීරණගන්නේ බලයට පත්වන ජනාධිපති නොව, ධනපති ඒජන්තවරුන් වන පී.බී. ජයසුන්දරලා, අජිත් නිවාඩ් කබ්රාල්ලා හා අද බලසම්පන්නව සිටින මිලිටරිය විසින් ය. රනිල්ගේ අත්තනෝමතික ධනපති පාලනයකට සහයෝගය දීමට හෝ මහින්දගේ අත්තනෝමතික පාලනයට තවදුරටත් සහයෝගය දීම සඳහා නොව ජනතාව පෙළගැස්විය යුත්තේ, තමන්ගේම සැලසුම් හදාගැනීමටත්, ඒවා තමන් විසින්ම ක්‍රියාවට නැඟීමටත්, ඒවා පිළිබඳ පොරොන්දු දීමට පහළ සිට ඉහළට සියලු පාලකයින්ට බලකිරීමටත්, ඒවා ඉටුකරවාගැනීම සඳහා සටන් කිරීමටත් ජනතාව සූදානම් කිරීම ය.

මහින්ද එපා වනවිට රනිල් බලයට පත්කරවීම යනු රනිල් එපා වනවිට යළිත් මහින්ද බලයට පත්කරවා ගැනීමට, ජනතාව හුරුකිරීමකි. මෙය ලංකාවේ මැතිවරණ දේශපාලනයේ 1956 සිය හුරු වු දෙයකි. දැන්වත් එයින් මිදීම ගැන සිතා බැලිය යුතු නැද්ද?

**සරත් ප්‍රනාන්දු**
**උපදේශක**
**ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය**
**2014 සැප්තැම්බර් 05**